www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජාතීන්ගේ රැස්වීමේ දී ශ්‍රී ලංකා ජනාධිපති වාර්ගික සිවිල් යුද්ධය යුක්ති සහගත කිරීමට යත්න දරයි

## Sri Lankan president at the UN seeks to justify communal civil war

**විජේ ඩයස් විසිනි**
**2008 ඔක්තෝබර් 6**

සැප්තැම්බර් 24 දා පැවති එක්සත් ජාතීන්ගේ මහා මන්ඩල වාර්ෂික රැස්වීම අමතමින්, අනෙකුත් නායකයන් මෙන් ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ ද, රැස්වීමේ ප්‍රධාන වේදිකාවේ කතා කිරීමට තමන්ට වෙන් වී තිබූ අවස්ථාව ලබා ගත්තේ ය. රැස්වීමේ තේමාව වී තිබුනේ ගෝලීය ආහාර අර්බුදය හා එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රජාතාන්ත්‍රික කිරීම වුව ද, පට්ට ගැසූ සැඳහුම් කීපයකින් මේ ගැටලු පසෙක ලූ රාජපක්ෂ, ඔහුගේ ආන්ඩුව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව යලි ආරම්භ කල සිවිල් යුද්ධය වෙත මාරු විය.

රාජපක්ෂ කතා කලේ ආරක්ෂකවාදී ස්ථාවරයක හිඳිමිනි. බිඳ වැටුනු සාම ක්‍රියා දාමය නිරීක්ෂනය කරමින් සිටින එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය සහ නෝර්වේ රාජ්‍යය ඇතුලු ප්‍රධාන බලවතුන් හැම දෙනා ම, ශ්‍රී ලංකාන්ඩුව 2002 සටන් විරාමය ඉරා දමා ආපසු යුද්ධය කරා යාමට පියවර ගත් විට නිහඬව හිඳ ඊට සහාය දී ඇත. කෙසේ වුව ද, ශ්‍රී ලංකාන්ඩුවත් එහි මිලිටරියත් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උල්ලංඝනය කිරීම පිලිබඳව ලැබෙන සාක්ෂ්‍ය සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහල නැගෙද්දී, ජාත්‍යන්තර විවේචන එල්ල වී තිබේ. තම මන්ත්‍රී ධුරය රැක ගැනීම සඳහා සහාය ගොනු කර ගැනීමට ඩොලර් මිලියන ගනනින් වැය කල ද, මේ වසර මුල දී ජිනීවාවේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ සාමාජිකත්වය ශ්‍රී ලංකාවට අහිමි විය.

ආන්ඩුව, විශේෂයෙන් ම, මානව හිමිකම් පිලිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තීන් උල්ලංඝනය කරමින් සිටින්නේ ය යන කරුන පදනම් කර ගෙන, යුරෝපා සංගමය දැන් ශ්‍රී ලංකාවෙන් තම "ජීඑස්පී ප්ලස්" (GSP+) වෙලෙඳ පහසුකම ඉවත් කිරීමට තර්ජනය කරමින් සිටී. මේ "ජීඑස්පී" තීරු බදු සහන අහිමි වීම, යුරෝපා වෙලෙඳ පොලවල්වල අනුග්‍රාහකාත්මක සැලකිල්ල මත බරපතල ලෙස රැඳී පවතින ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයට එල්ල වන දැවැන්ත පහරක් වනු ඇත. යුරෝපා සංගමයෙහි හා එක්සත් ජනපදයෙහි ආර්ථික මන්දගාමිත්වයක් ඇති වුව හොත් ශ්‍රී ලංකාවෙහි ඇඟලුම් කම්කරුවන් 200,000කගේ රැකියා අහිමි වී යා හැකි ය.

පලමු කොට, තමන් එල්ටීටීඊයට එරෙහිව යලි ආරම්භ කල යුද්ධය ගෝලීයව සිදු වන

"ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" කොටසකැයි පවසමින් එය යුක්ති සහගත කරන රාජපක්ෂ, "වේගයෙන් පැතිරෙන ත්‍රස්තවාදී තර්ජනයට" එරෙහිව සටන් වැදීමෙහි ලා එක්සත් ජාතීන්ගේ සංවිධානය "නිශ්චිත පියවරක්" ගත යුතු යැයි ඉල්ලා සිටී. ඉරාකය හා ඇෆ්ඝනිස්ථානය වාඩි ලා ගැනීමේ දී එක්සත් ජනපදය හා එහි මිත්‍ර පාක්ෂිකයන් කල අපරාධවලට සහාය දීමෙන් රාජපක්ෂ කරන්නේ ශ්‍රී ලංකාවෙහි තමන් ගෙන යන සාපරාධී යුද්ධයට සහාය ඉල්ලා ආයාචනය කිරීම යි. එහි එක්සත් ජනපද සගයා මෙන් ම ශ්‍රී ලාංකික මිලිටරිය ද, එල්ටීටීඊ පාලනය යටතේ පවතින ප්‍රදේශවල සිවිල් වැසියන් සිය ගනනින් ඝාතනයට ලක් කරමින් ද සියදහස් ගනන් ජනයා නිවාසවලින් පලවා හරිමින් ද, වගවිභාගයක් නැති බෝම්බ හෙලීම් හා ෂෙල් වෙඩි ප්‍රහාර යොදා ගෙන ඇත.

දිවයිනේ වෙසෙන දෙමල ජන සුලුතරයට එරෙහිව තම ආන්ඩුව ගෙන යන යුද්ධයේ වාර්ගික ස්වභාවය වසන් කිරීම උදෙසා සැලසුම් කල මුසාවන්ගෙන් රාජපක්ෂගේ කතාව පිරී තිබින. හෙතෙම මෙසේ කී යඃ "වසර විසිපහකටත් වැඩි කාලයක් තිස්සෙ, ශ්‍රී ලංකාව තුල බලයට පත් වෙච්ච හැම ආන්ඩුවක් ම [දෙමල ජන සුලුතරයේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පිලිබඳ] ගැටලුව විසඳන්න බලගතු පරිශ්‍රමයක් දරල තියෙනව. නෝර්වීජියානු පහසුකම් සපයන්නන් හා ත්‍රස්තවාදීන් අවඥාවෙන් සැලකූ ඊනියා සාම ක්‍රියා දාමය නිරීක්ෂනය කරපු ජාත්‍යන්තර සමසභාපතිවරුන් හරහා කරපු වැඩ කටයුතුත් මේකට ඇතුලත්. සාමය ඇති කරන්න උත්සාහ දරමින් සාකච්ඡා පවත්වපු හැම අවස්ථාවක දී ම, නිදහසට ඉතා ම දුර්වල කරුනු ඉදිරිපත් කරමින් ඒවයින් ඉවත් වෙලා ගිය එල්ටීටීඊ ත්‍රස්තවාදීන්, වගවිභාගයකින් තොරව අහිංසක සිවිල් වැසියන් ඉලක්ක කර ගනිමින් නරක ම විදියෙ ත්‍රස්තවාදීන් බවට පත් වුනා."

මේ වනාහි ඓතිහාසික වාර්තාව උඩුයටිකුරු කිරීම සඳහා දරන ලද තුච්ඡ ප්‍රයත්නයකි. එල්ටීටීඊයේ මතු වීම "ත්‍රස්තවාදයේ" නිෂ්පාදිතයක් නො වේ. එය කම්කරු පන්තිය බෙදීම සඳහා සිංහලෝත්තමවාදය

උසි ගැන්වීමට මාන බැලූ ශ්‍රී ලංකාවේ ආන්ඩු දශක ගනනාවක් තිස්සේ අනුගමනය කල ක්‍රමානුකූල දෙමල විරෝධී වෙනස්කම් කිරීම් මගින් ජනනය වූ ඉච්ඡා භංගත්වයේ හා කෝපයේ නිෂ්පාදිතයක් විය. එල්ටීටීඊය යනු වෙන ම දෙමල රාජ්‍යයක් ඉල්ලන සුලු ධනේශ්වර ජාතිකවාදී සංවිධාන ගනනාවකින් එකකි. විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුලත් කර ගැනීමේ දී හා රජයේ රැකියාවලට සේවකයන් බඳවා ගැනීමේ දී දෙමල ජනයා වැඩි වැඩියෙන් ඉන් බැහැර කිරීමට, දෙමල කතා කරන ජනයාට එරෙහිව නිල මට්ටමින් ප්‍රකාශයට පත් වූ අගතිදායක හැඟීම්වලට හා බුද්ධාගම රාජ්‍ය ආගම හැටියට ඔසවා තැබීමට ප්‍රතිචාර දැක්වීමක් වශයෙනි 1970 ගනන්වල දී මේ සංවිධාන පැන නැගී ආවේ.

කලින් ද මිලිටරිය හා සන්නද්ධ දෙමල කන්ඩායම් අතර සීමිත ආකාරයක ගැටුම් ඇති වී තිබුන ද ගැටුම අංග සම්පූර්න සිවිල් යුද්ධයක් බවට වර්ධනය වූයේ 1983 දී ය. ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනගේ එක්සත් ජාතික පක්ෂ ආන්ඩුව, සිය වෙලෙඳ පොල ප්‍රතිසංස්කරනවලට කම්කරුවන්ගෙන් එල්ල වූ වැඩෙන විරුද්ධත්වයකට මුහුන දුන් තතු යටතේ, සිය ගනනක් ජනයාගේ ජීවිත වනසමින් 1983 ජුලි මාසයේ දී ලේ වැකි දෙමල විරෝධී සංහාරයක් මුදා හලේ ය. අනතුරුව, සන්නද්ධ කැරැල්ල "හය මසක් ඇතුලත" කුඩු කිරීමට අන දී උතුරට හමුදා යවනු ලැබින. වසර 25කට ආසන්න කාලයකට පසුව ඔප්පු වී ඇත්තේ, 80,000කට ආසන්න ජන සංඛ්‍යාවකගේ ජීවිත බිලි ගත් බවට ගනන් බලා ඇති මේ යුද්ධය අවසන් කිරීමට බලයට පත් ආන්ඩු අසමත් වූ බව යි.

"ගැටලුව විසඳීමට" ආන්ඩු උත්සාහ දරා ඇතැයි රාජපක්ෂ කරන ප්‍රකාශය ප්‍රෝඩාවකි. ඉතා මෑතක දී, එනම් 2002 දී, එල්ටීටීඊය හා එය නියෝජනය කරන දෙමල ප්‍රභූ පෙලැන්තිය සමග කිසි යම් ආකාරයක බලය බෙදා ගැනීමේ වැඩ පිලිවෙලක් කරා ලඟා වීමට නම් නොයෙක් ප්‍රයත්නයන් දරා තිබේ. කෙසේ වුව ද, කොලඹ දේශපාලන සංස්ථාපිතය මුලුමනින් ම සිංහල ස්වෝත්තමවාදයට නතු වීම හේතු කොට ගෙන ඒ සියල්ල අසාර්ථක විය. සාම ක්‍රියා දාමය මව් බිම පාවා දීමකැයි හෙලා දකිමින් රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) හා සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) කර ගෙන ගිය දුෂ්ට වාර්ගික උද්ඝෝෂනය මධ්‍යයේ, 2002-2003 සමයේ දී එක්සත් ජාතික පක්ෂය නායකත්වය දුන් ආන්ඩුව මුල පිරූ සාම කතාබහ වේගයෙන් බිඳ වැටින.

රාජපක්ෂ 2005 ජනාධිපතිවරනය යන්තමින් ජය ගත්තේ, ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියා දාමයේ පදනම හැටියට පැවති සාධක ප්‍රතික්ෂේප කල ක්‍රියා මාර්ගයකට අවතීර්න වී ජවිපෙ සහාය ලබා ගැනීමෙනි. ජනාධිපති තනතුර හිමි වීමෙන් අනතුරුව නින්දිත, අප්‍රකාශිත ප්‍රකෝපකාරී යුද්ධයක නියැලෙන්නට මිලිටරියට අවසර දුන් ඔහු, 2002 සටන් විරාම ගිවිසුම යලි රචනා කල යුතු යැයි ඉල්ලීමක් කොට සාම සාකච්ඡා වනසා දැමී ය. 2006 ජුලි මාසයෙහි, ජනවාරියේ දී සිය ආන්ඩුව ඒකපාර්ශ්වීයව අවසන් වශයෙන් ඉවත ලූ සටන් විරාම ගිවිසුමේ අඩංගු වූ කොන්දේසි නින්දිත ලෙස උල්ලංඝනය කරමින්, ආක්‍රමනයට පිවිසීමට රාජපක්ෂ මිලිටරියට අන දුන්නේ ය.

මොන යම් ආකාරයක හෝ වැඩි දුර කතාබහක් පිලිබඳ තමන්ගේ ආස්ථානය විස්තර කරමින් රාජපක්ෂ මෙසේ කියා සිටියේ යඃ "අපේ ආන්ඩුව මේ නීති විරෝධී සන්නද්ධ කල්ලිය එක්ක කතා කරන්න සූදානම් වෙන්නෙ, ඒ කල්ලිය තමන් සන්තකව තියෙන නීති විරෝධී ආයුධවල අධිකාර බලය පවරල දීල, තමන්ගෙ මිලිටරි ශක්තිය බිඳ විසුරුවා හැරල, ප්‍රජාතන්ත්‍රවාදී රැල්ලට ආපහු එන්න සූදානම් වුනා ම විතර යි." වෙනත් වචනවලින් කියන්නේ නම්, ශ්‍රී ලංකාන්ඩුව සම්පූර්න යටත් වීමක් ඉල්ලා සිටින අතර, එය සිදු වනු ඇත්තේ එල්ටීටීඊයේ සටන් ශක්තිය විනාශ කිරීමේ දී මිලිටරිය සාර්ථක වුව හොත් පමනකි.

රාජපක්ෂ දිවයිනේ නැගෙනහිර දී තම ආන්ඩුව ලද ජයග්‍රහන ගැන පුරසාරම් දෙඩී ය. එහි දී මිලිටරිය එල්ටීටීඊයේ ප්‍රධාන බල කඳවුරු අල්ලා ගෙන තිබේ. "ආන්ඩුවෙ අරමුන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා දාමයන්හි ප්‍රතිලාභ භුක්ති විඳින්න ජනතාවට හැකියාව ලබා දෙන එක. ත්‍රස්තවාදීන් බහුල වශයෙන් ඉන්න ඒ ප්‍රදේශවල සංවර්ධන වැඩ කටයුතු වේගවත් කරන එක. මේක ශ්‍රී ලංකාවේ නැගෙනහිර පලාතෙ සිද්ධ වෙමින් තියෙන වේගවත් ආර්ථික සංවර්ධනයට සමාන වේවි. කලින් ඒ පලාත්වල හිටපු ත්‍රස්තවාදීන් දැන් ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත් වුනු පලාත් සභා නියෝජිතයන් විදියට කටයුතු කරනව. එල්ටීටීඊය බලෙන් හමුදාවට බඳවා ගෙන හිටපු ලමා සොල්දාදුවෙක් ත්‍රස්තවාදය අත ඇරල ප්‍රජාතන්ත්‍රවාදය වැලඳ ගෙන දැන් මහ ඇමති විදියට තේරී පත් වෙලා."

මේ වසරේ නැගෙනහිරෙහි පැවැත්වුනු පලාත් සභා මැතිවරනය යනු රැවටිල්ලකි. ආන්ඩුව 20,000ක් පමන වූ හමුදා භට පිරිසකින් හා වෙනත් මිලිටරි කාර්ය මාන්ඩලිකයන්ගෙන් ද 27,000ක් වූ පොලිස් භට පිරිසකින් ද පලාත පිරවී ය. රාජපක්ෂගේ ශ්‍රීලනිපය එල්ටීටීඊයෙන් භේද වී 2004 දී ගොඩ නගා ගත් කුප්‍රකට පැරා මිලිටරි කන්ඩායමක් වන තමිල් මක්කල් විඩුදලෙයි පුලිහල් (ටීඑම්වීපී) සංවිධානය සමග සන්ධානයක් ගොඩ නගා ගත්තේ ය. ආයුධ ලඟ තබා ගැනීමට ටීඑම්වීපී මැරයන්ට අවසර ලැබුනු අතර, විරුද්ධ පක්ෂවලින් ද තර්ජනය කිරීම් හා ප්‍රචන්ඩ ක්‍රියා නිරීක්ෂන කටයුතුවල නිරත වූ මැතිවරන නිරීක්ෂකයන්ගෙන් ද ඔවුන්ට විශාල ලෙස චෝදනා එල්ල විය. "හිටපු ලමා සොල්දාදුවා" මෙන් ම මහ ඇමතිවරයා ද වන

පිල්ලෙයාන් ලෙස දන්නා ලැබෙන එස්. චන්ද්‍රකාන්තන් වනාහි, ළමුන් බලාත්කාරයෙන් යුද්ධයට බඳවා ගැනීම්, ඝාතන හා බලාත්කාරයෙන් මුදල් රැස් කිරීම් සම්බන්ධයෙන් දේශීය හා විදේශීය මානව හිමිකම් කන්ඩායම්වල විවේචනවලට ලක්ව තිබෙන ටීඑම්වීපීයේ නායකයා යි. "ආර්ථික සංවර්ධනය" සම්බන්ධයෙන් ගත හොත්, ලාභ ශ්‍රමය ගසා කෑම සඳහා විදේශීය ආයෝජකයන්ට අධිආරක්ෂිත කලාපයක් තුල නිදහස් වෙලෙඳ කලාපයක් පිහිටුවා දීමට, මිලිටරිය දහස් ගනන් ජනයා සිය නිවාසවලින් හා ඉඩම්වලින් පලවා හැර ඇත.

සටන්කාමී කෲර කන්ඩායමක නායකයෙකු මුදුනෙහි සිටින පලාත් සභාවකින් නාමිකව පාලනය වන නැගෙනහිර පලාත, ආන්ඩුව විසින් මිලිටරි වාඩි ලා ගැනීමක් යටතේ තබනු ලැබ ඇත. ප්‍රජාතන්ත්‍රවාදය විකෘත කරන මේ සරදම මගින්, ශ්‍රී ලංකාවේ උතුර වෙනුවෙන් පමනක් නො ව රටේ අනෙකුත් කොටස් සම්බන්ධයෙන් ද, රාජපක්ෂ සූදානම් කරමින් තිබෙන දේ පෙන්නුම් කෙරේ. තමන්ගේ පිලිවෙත්වලට එරෙහිව වර්ජනවලට හෝ විරෝධතාවල නිරත වන සෑම කම්කරු, සිසු හෝ ගොවිජන කොටසක් ම, "යුද ප්‍රයත්නය කඩාකප්පල් කරන්නේ යැ"යි ද "ත්‍රස්තවාදීන්ට සහාය දෙන්නේ යැ"යි ද කියමින් ආන්ඩුව විසින් පුරුද්දක් ලෙස හෙලා දකිනු ලැබේ.

සැබවින් ම, එක්සත් ජාතීන්ගේ මහා මන්ඩලයෙහි සිටි කිසිවෙකු රාජපක්ෂගේ මුසාවන්ට හා අභූත කතාවලට අභියෝග කලේ නැත. "මානව අයිතීන්" පිලිබඳ නිහඬ වී ගිය විවේචන දැන් යලි මතු වෙමින් පවතින්නේ නම්, ඒ යුද්ධය අනෙකුත් රටවල අවශ්‍යතා යට කර ගෙන යාමට තර්ජනය කරන බැවිනි. ශ්‍රී ලංකාවේ පුවත්පත් සඳහන් කල පරිදි, එක්සත් ජනපද උපජනාධිපති අපේක්ෂක සාරා පාලින් ඇතුලු වෙනත් බොහෝ දෙනා හමු වන්නට කාලය සොයා ගත් බව පෙනෙන්නට තිබූ ඉන්දියානු අගමැති මන්මෝහන් සිං බැහැ දැකීම සඳහා අවස්ථාවක් ලබා ගන්නට රාජපක්ෂ අසමත් විය. රාජපක්ෂගේ යුද්ධයට දේශපාලනික හා මිලිටරිමය අංශවලින් නිහඬව සහාය පුදන අතරවාරයේ, ගැටුමේ බලපෑම හේතු කොට ගෙන කෝපයට පත්ව සිටින දකුනු ඉන්දියාවේ දෙමල ජනයා අතර වර්ධනය වී එන දේශපාලන නොසන්සුන්තාවකට සිං මුහුන දෙමින් සිටී. එක්සත් ජනපදය හා යුරෝපා සංගමය ද එලෙස ම යුද්ධයට සහාය දී ඇති නමුත්, එමගින් කලාපය අස්ථාවර වීමට, විශේෂයෙන් ම ප්‍රධාන බලවතුන්ට සැලකිය යුතු ආර්ථික අවශ්‍යතා පවතින ඉන්දියාව අස්ථාවර වීමට තිබෙන ඉඩකඩ ගැන ඔවුහු උත්සුක කරනු ලැබ සිටිති.

ශ්‍රී ලංකාවේ දී මාධ්‍ය විසින් උත්කර්ෂවත් වදන්වලින් යුතුව රාජපක්ෂගේ කතාව පිලිබඳ වාර්තා විශාල සංඛ්‍යාවක් පල කොට ඇත. වඩා බලගතු ජාත්‍යන්තර සහායක් දිනා ගැනීමට ඔහු අසමත් වීම සම්බන්ධයෙන් මෘදු විවේචනයක් හෝ කෙරෙන්නට ඇති ඉඩකඩ සීමා කොට තිබේ. කුමන උපායාත්මක නොඑකඟතාවන් පැවතුන ද, කොලඹ සමස්ත දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතය ම දිවයිනෙහි අඛන්ඩව සිදු වී ගෙන යන වාර්ගික ලේ වැගිරීමට වගකිව යුතු ය.

© www.wsws.org